සිවිල්ක්ෂේත්‍ර ජනාධිපති ලේ.
අමා./ ලේ.
~~ප්‍රතිපත්ති~~
රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍ය ලේකම්,
~~ලේකම්~~ ප්‍රමුඛ සම්බන්ධීකරණ අමාත්‍යාංශයේ ලේකම්,

මගේ අංකය:- අමප/1982/305(0)
ඔබේ අංකය:
1982 ජූලි මස 28 වන දින,
අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී ය.

නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරි කටයුතුවල නිරතව සිටියදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මරුමුවට පත්වූ හෝ සදාතනික ආබාධිත තත්ත්වයට පත්වූ හෝ සන්නද්ධ සේවා සහ පොලිස් නිලධාරීන් සඳහා වන විශේෂ විධිවිධාන

1982 ජූලි මස 21 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ එලෙස තීරණයක් අදාල කටයුතු කරනු සඳහා රට අදාල නිලධාරීන්ට දැන්වීම පිණිස මේ සමඟ එවා ඇත.

අ.ම./ එච්.ඩබ්.පී. පෙරේරා,
අතිරේක ලේකම්,

අ.ම./ ටී.වී.පී. සමරසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

43. 1982 අංක 305 (9 වන අවුරුදුවේදය) ලෙස පසුව අංක ගත කෙරුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව වූ, "නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරි කටයුතුවල නිරතව සිටියදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මරුමුවට පත්වූ හෝ සදාතනික ආබාධිත තත්ත්වයට පත්වූ සන්නද්ධ සේවා සහ පොලිස් නිලධාරීන් සඳහා වන විශේෂ විධිවිධාන" යන මැතිසේ අධ්‍යක්ෂිතුමා සහ රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සටහනක්, සලකා බලනු ලදුව,

(අ) මෙහෙයුම් රාජකාරි කටයුතු කිරීමේදී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු නියා හෝ මරුමුවට පත්වූ, සන්නද්ධ සේවා සහ පොලිස් නිලධාරීන්ගේ ඉහ කිරීවූ හැකිවරයාට, එසේ මරුමුවට පත්වූ නිලධාරියාගේ මරණයට පත් දිනට පෙරවන ලද සම්පූර්ණ වැටුප සහ දීමනා, ඔහු ජීවිතව සිටියේ නම් ඔහු වයස අවුරුදු 55 ට එළඹෙන කාලය දක්වා ගෙවීම;

(ආ) මෙහෙයුම් රාජකාරි කටයුතු කිරීමේදී හෝ ත්‍රස්තවාදී ක්‍රියා කිසා හෝ වෙනත් නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු හේතුවෙන් හෝ තුවාල හෝ සන්නද්ධ සේවා නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට තුවාල ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ආබාධිතයෙකුවූ, දේවයෙන් ඉවත්වීමට සිදුවූවේ නම්, ඔහු එබඳු තුවාල ලැබූ අවස්ථාවේදී ලබමින් සිටි සම්පූර්ණ වැටුප සහ දීමනා ඔහු වයස අවුරුදු 55 ට එළඹෙන තෙක් ගෙවීම;

(ඇ) එවැනි නිලධාරීන් ජීවිතව සිටියේ නම් සහ සේවයේ නියුක්තව සිටියේ නම් තවදුරටත් ලැබෙන තවර හෝ වැටුප් දීමනා වැඩිවීම් ඉහත සඳහන් (අ) සහ (ආ) වර්ගවල අයට ද ගෙවීම;

(ඇ) මෙම තීරණය ක්‍රියාත්මක කිරීමේ දිනය අතීතයටද බලපෑම් පරිදි 1977.7.22 වන දින සිට වීම සහ මෙම යෝජනාව සවසේ ගෙවීම් කිරීම අමාත්‍ය මණ්ඩල තීරණයේ දින සිට ඇරඹිය කිරීම; සහ

(ඉ) ඉහත විස්තර කර ඇති පරිදි සැලකිල්ලට භාජනය කළයුතු වන, 1977.7.22 ට පෙරාතුව ඇති වූ නිසියම් විශේෂ සිද්ධියක් පරිබන්ධයෙන්, ඒ උදේ එක් අවස්ථා පදනම් කොට පරීක්ෂාකර බැලීම;